
ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සහකාර ආරක්ෂක නිලධාරි තනතුර
(කොන්ත්‍රාත් පදනම මත)

ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව



ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර ආරක්ෂක නිලධාරි තනතුරේ සේවය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට සලකා බැලීම සඳහා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් විශේෂ කාර්ය බලකායේ නිත්‍ය සේවයේ රාජකාරි කරන ලද, පහත අවශ්‍යතා සපුරා ඇති, සුදුසුකම්ලත් මනා පළපුරුද්දක් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.0 කාර්යය/වගකීම් :

- ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලු ම සේවකයින්ට තම කාර්යයන් ප්‍රශස්ත මට්ටමින් ඉටු කිරීමට පහසුකම් සැලසීම සඳහා සුදුසු ආරක්ෂිත වටපිටාවක් සහතික කිරීම.
- ඇති විය හැකි බාහිර අවදානම්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින්, පිටතින් පැමිණෙන්නන් සහ එහි දේපළ සහ වත්කම් ආරක්ෂා කිරීම.

2.0 අවශ්‍ය අවම සුදුසුකම් හා පළපුරුද්ද :

2.1 අධ්‍යාපන සුදුසුකම් :

- අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් හයක් (06) වක් වරක දී සමත් ව තිබීම.
- අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් ව තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

2.2 ශාරීරික යෝග්‍යතාව :

- උස — පිරිමි : අවම වශයෙන් සෙන්ටිමීටර 165 (5′ 5″)
  ගැහැණු : අවම වශයෙන් සෙන්ටිමීටර 162.5 (5′ 4″)
- බර — පිරිමි : 20 < ශරීර ස්කන්ධ දර්ශකය < 27
  ගැහැණු : 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25
- පපුව — පිරිමි : අවම වශයෙන් සෙන්ටිමීටර 81.3 (32″)

සියලු ම අයදුම්කරුවන් රටේ ඕනෑ ම ප්‍රදේශයක ඕනෑම ක්ෂේත්‍ර රාජකාරියක් ඉටු කිරීම සඳහා වෛද්‍යමය වශයෙන්, ශාරීරික ව සහ මානසික ව යෝග්‍ය විය යුතු ය.

2.3 වයස :

- පිරිමි - 2026.11.23 දිනට අවුරුදු 40ට නොඅඩු සහ අවුරුදු 50ට නොවැඩි විය යුතු ය.
- ගැහැණු - 2026.11.23 දිනට අවුරුදු 35ට නොඅඩු සහ අවුරුදු 50ට නොවැඩි විය යුතු ය.

2.4 පළපුරුද්ද :

- පිරිමි පුද්ගලයින් සඳහා අවම වශයෙන් අවුරුදු 22ක සහ කාන්තාවන් සඳහා අවම වශයෙන් අවුරුදු 15ක කාලයක් ත්‍රිවිධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ නිත්‍ය සේවයේ නිකැළැල් අඛණ්ඩ සේවයක් සපුරා තිබීම.
- විශේෂ බලකා, බෝම්බ නිෂ්ක්‍රීය කිරීම, විනයාරක්ෂක, අවි ආයුධ හෝ ශාරීරික පුහුණු උපදේශක, ගිනි ආරක්ෂක, සන්නිවේදන, බුද්ධි අංශ වැනි ක්ෂේත්‍රවල විශේෂඥතාව අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

2.5 ත්‍රිවිධ හමුදාවේ / ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ දැරූ නිලය :

- ශ්‍රී ලංකා යුද, නාවික හෝ ගුවන් හමුදාවේ සැරයන් / සුළු නිලධාරි (Sergeant / Petty Officer) හෝ ඊට ඉහළ නිලයක් දැරූ හෝ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ සැරයන් (Sergeant) හෝ ඊට ඉහළ නිලයක් දැරූ විශ්‍රාමික කොමිෂන් නොලත් නිලධාරියෙකු විය යුතු ය.

3.0 සේවා නියුක්තිය :

- වසර තුනකට (03) නොවැඩි කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනේ. ආරම්භයේ දී වසරක (01) කාලයක් සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරනු ලබන අතර, එක් එක් වසර අවසානයේ දී අදාළ නිලධාරියාගේ කාර්ය සාධනය සහ බැංකුවේ අවශ්‍යතාව මත පදනම් ව ගිවිසුම දීර්ඝ කිරීමට සලකා බලනු ඇත.
- කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන නිලධාරීන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථිර සේවක මණ්ඩලයට අන්තර්ග්‍රහණය කරනු නොලැබේ.

4.0 වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ :

- රු. 100,000.00ක මාසික දීමනාවක් (බදු ගෙවිය යුතු), සේවක අර්ථසාධක අරමුදල (EPF), සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) සඳහා දායකත්වය සහ වෛද්‍ය ප්‍රතිලාභ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය

නියමිත අවම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පමණක් ඉදිරි ඇගයීම් සඳහා කෙටි ලැයිස්තුගත (Shortlist) කරනු ලබන අතර, එම ඇගයීම්වලට ලිඛිත විභාගයක්/ඇගයීමක්, වෛද්‍ය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් ඇතුළත් විය හැකිය.

අයදුම්පත්

තනතුර සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ට **https://www.cbsl.gov.lk/en/careers** යන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් නියමිත අයදුම්පත බාගත කරගත හැකිය.

නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතු අතර, අවශ්‍ය සියලු ලිපි ලේඛන සහිතව **(උදා., උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, අ.පො.ස. (සා.පෙළ) සහ (උ.පෙළ) සහතිකපත්, ත්‍රිවිධ හමුදා සේවා සහතික පොත / ශ්‍රී ලංකා පොලීසියේ සේවා සහතික, වෙනත් සුදුසුකම්, පුහුණු වැඩසටහන්වලට අදාළ සහතික සහ වෙනත් අදාළ ලේඛන)** නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.11.23 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ / මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතු ය.

අයදුම්පත් එවීමේ දී “සහකාර ආරක්ෂක නිලධාරි තනතුර (කොන්ත්‍රාත් පදනම මත)” යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා නොමැති අයදුම්කරුවන් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි. අදාළ සුදුසුකම් සපුරා නොමැති හෝ අවසන් දිනයට පසුව ලැබෙන හෝ නියමිත ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයට පෙර පැවැත්වෙන සහතික පත්‍ර පරීක්ෂා කිරීමේදී අදාළ සහතිකපත්‍රවල / ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අසමත් වන අයදුම්කරුවන් කිසිදු ආකාරයකින් තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම්ලත් අයදුම්කරුවෙකු ලෙස නොසැලකේ.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ. බඳවා ගනු ලබන සංඛ්‍යාව තීරණය කිරීමේ, බඳවා ගැනීමේ ක්‍රියාවලිය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕළඟ පියවර සඳහා සම්බන්ධ කරගනු ලබන්නේ කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණි.

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන, තෝරාගනු ලබන සියලුම අපේක්ෂකයින් සඳහා අදාළ වේ.

අධ්‍යක්ෂ - මානව සම්පත්
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක. 30, ජනාධිපති මාවත, කොළඹ 01.
දු.ක - 011-2477330 ෆැක්ස් - 011-2477715